ශ්‍රී ලංකාවේ ප්‍රථම මාක්ස්වාදී සංග්‍රහය

# සමසමාජය

පුවත්පතක් වශයෙන් අංක සී 30 යටතේ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 16 වෙළුම 16 කලාපය 2007 දෙසැම්බර් 19 මිල රු.5/-

## ලංකා සමසමාජ පක්ෂයේ 72 වැනි සංවත්සරයේ විශේෂ කලාපය



## අපි ඔබ සදා සමරන්නෙමු.

දහසක් දුක් පීඩා විඳ අනෙ - අප වෙනුවෙන් ඔබ සොහොයුරනේ
දහසක් සූරිය මල් පිබිදෙනු අනෙ - ඔබේ නමින් අපෙ ලක් දෙරණේ

# ඉදිරියටම පා නගමු!

**ලංකා සමසමාජ පක්ෂය සිය අභිමානවත් ගමනේ 72 වන වසර පසු කිරීම අදට යෙදී ඇත. 73 වන වසරට පා තබන්නේ 'අරගලයෙන්ම - අරමුණට' යන තේමාව මුල් කර ගනිමිනි. ගෙවී ගිය වසර 72 ම සටන් සහ අරගලවලින් ගහන යුගයක් විය. ජනතාව භුක්ති විඳින වරප්‍රසාද වැඩිම කොටසක් එම අරගල වල ජයග්‍රහණ බව සඳහන් කරන්නේ ආඩම්බරයෙනි.**

අධිරාජ්‍යවාදීන්ගෙන් අප රට නිදහස් කර ගැනීම සඳහා ගෙන ගිය අරගලය එහි ප්‍රධාන තැනක් ගනී. ඉදිරි වසර අප රටටත්, ලංකා සමසමාජ පක්ෂයටත්, අභියෝග කිහිපයකට මුහුණ දීමට සිදුවේ. එනම්, දශක කිහිපයක සිට දකුණේ සහ උතුරේ පවතින ජාතිවාදී රැල්ලෙන් අප රට මුදවාගෙන සියළු ලාංකික ජනතාව යුදබියෙන් තොර සාමකාමී ලංකාවක් ඇතිකර දීමය. ඒ සඳහා යුදවාදී, ජාතිවාදී බලවේග පරාජය කරමින්, ජනවාර්ගික ප්‍රශ්නයට සියළුම ලාංකිකයින්ට පිළිගත හැකි සාධාරණ දේශපාලන විසඳුමක් සර්ව පාක්ෂික සමුළුව මගින් ලබාදීමට ආණ්ඩුව යොමු කළ යුතුය. අධිරාජ්‍යවාදීන්ගේ වහල් බැමි බිඳිමින්, 1972 දී ලංකාව නිදහස් ස්වෛරී ජන රජයක් බවට පත් කරගත්තායේම උතුරේ ජාතිවාදී ප්‍රශ්නයට විසඳුම් සෙවීම ද ලංකා සමසමාජ පක්ෂය ප්‍රමුඛ වමේ පක්ෂ වලට ඉතිහාසයෙන් බාර වී ඇති අද්විතීය හා ඓතිහාසික කටයුත්ත බව අපි පෙන්වා දෙන්නෙමු.

ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුම් ලබාදීමට උත්සුක වන්නායේම අප රටේ ජනතාවගේ, ආර්ථික තත්ත්වය නගා සිටුවමින් ජන ජීවිතය සුබිත මුදිත කිරීම සඳහාත්, දැනට රටේ පවතින තරුණ අසහනය, දුරු කිරීම සඳහාත්, දූෂණය හා අකාර්යක්ෂමතාවය නිම කරමින් සාධාරණ සහ ක්‍රමවත් ආර්ථික ක්‍රමයක් ඇතිකිරීමට කටයුතු කිරීම තවත් කර්තව්‍යයක් බව අපි මෙහිලා සඳහන් කරමු.

1978 ව්‍යවස්ථාව වෙනස් කරමින් ඒ හා බැඳුනු විධායක ජනාධිපති ක්‍රමයත්, මනාප ඡන්ද ක්‍රමයත්, අහෝසි කොට ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ මනාව පිළිබිඹු කරන ව්‍යවස්ථාවක් හා ඡන්ද ක්‍රමයක් සකස් කිරීම ඉදිරි වසරේ දී ඇති තවත් අරමුණක් ලෙස සටහන් කර ගත යුතුව ඇත.

ඉහත සඳහන් කර ඇති තෙවැදෑරුම් අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සහෝදර අනිකුත් වමේ පක්ෂත් සමඟ අන්‍යෝන්‍ය අවබෝධයකින් කටයුතු කිරීම සහ එම අරමුණු කරා ගමන් කිරීම ලංකා සමසමාජ පක්ෂයට ඉදිරි වසරේ ඇති කර්තව්‍යය බව සනිටුහන් කරන්නෙමු.

සමාජවාදය අදටත් ධනවාදයට විකල්ප මාර්ගයයි. චීනය හා කියුබාව තමන්ගේ සමාජවාදී මෙහෙවර එලෙසම ඉටු කරමින් සිටින අතර ඇමෙරිකාව විසින් අවඩන ලද විවෘත ආර්ථිකයෙන් මිදී ලතින් අමෙරිකානු රටවල් වූ බ්‍රසීලය, ආර්ජන්ටිනාව සහ වෙනිසියුලාව වැනි රටවල් සමාජවාදී ආර්ථික මගක් ගමන් කිරීම අරඹා සිටී. මෙය ලෝකයේ සමාජවාදීන්ට අස්වැසිල්ලකි. ආශිර්වාදයකි.



ගන්දුර පහව යයි දිවයුරු හැඟුණ සැණින්
අඳුරේ පලා ගියේ ලසසප කළ සටනින්
ධනපති බල බිඳිනු අප සමඟ එකතු වෙමින්
අරමුණ කරා යමු ! ජන අරගලය තුළින්

- ජගත් සේමචන්ද්‍ර

එය සිත්හි දරා තබාගනිමින් අප රට ද කොම්පදෝරු ධනපති පංති ආර්ථිකයෙන් මුදවා සමාජවාදී දිසාවට ගමන් කරවීම අපේ කෙටිකාලීන සහ දිගුකාලීන අරමුණ වේ. ඒ අරමුණු සපුරා ගැනීම සඳහා රට

ඉදිරියට ගෙනයාමට අරගල කළ යුතුය. ඉහත දැක්වූ අභියෝගාත්මක අරමුණු සාක්ෂාත් කර ගත හැක්කේ ලංකාසමසමාජ පක්ෂය අනෙකුත්වමේ පක්ෂ සහ ජනතාව සමඟ
අත්වැල් බැඳ

ඉදිරියට ගෙනයාමට අරගල කළ යුතුය. ඉහත දැක්වූ අභියෝගාත්මක අරමුණු සාක්ෂාත් කර ගත හැක්කේ ලංකා සමසමාජ පක්ෂය, අනිකුත් වමේ පක්ෂ සහ ජනතාව සමඟ අත්වැල් බැඳ ගනිමින් ගෙන යන ජනතා අරගල මැදින් බව "සමසමාජයේ" අදහසයි. එම අරමුණු සාක්ෂාත් කර ගැනීමට අරගලය තුළින් අරමුණ කරා ගමන් කිරීමට ල.ස.ස.පයට ශක්තිය, ධෛර්ය ප්‍රාර්ථනා කරමු.

### පඹ්හුමා...



[illegible] ...

[illegible] ...

**අරගලයෙන්ම ➤ අරමුණට**

අංක 457,
ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත,
කොළඹ 02.
ටෙලි: 2679544
www. samasamaja.org

## 72 වසරක පසු විපරමක්

ලංකා සමසමාජ පක්ෂයේ 72 වන සංවත්සරය අදට යෙදී ඇත. ගෙවී ගිය වසර 72 දී ජනතාවගේ අභිලාෂයන් මුදුන්පත් කිරීමට කටයුතු කර අද්දුටු සහ පසුවිපරමක් කිරීමට යෝග්‍ය දිනය ලෙස අද දිනය අපි සලකන්නෙමු.

[illegible]

[illegible]

[illegible]

[illegible]

[illegible]

[illegible]

72

# අරමුණටම යෑමේ අරගලය අරඹමු.!

1934 වැනි අතීත කාලයේ මෙරට පැවති සමාජයීය, ආර්ථික හා දේශපාලනමය තත්ත්වයන් වෙනස් කළ හැකි පිරිසකගේ අඩුව පිරිමසාලීමට සමත්වූයේ 1935 කාලයේ දී බිහි වූ ලංකා සමසමාජ පක්ෂයයි. ඒ තුළ අද මෙන් නොව නියම ජාතිහිතෛෂී හැඟීම් ඇති අය සිටියා පමණක් නොව, අධිරාජ්‍ය ගැති, ධනපති බැමි කඩා බිඳ දමන්නට තරම් ශක්තිමත් හා ඕනෑකමක් ඇති ශ්‍රී ලාංකිකයෝ පෞද්ගලික නායය පසුපස් පසෙක තබා, පොදු වැඩ පිළිවෙලක් සකස් කොට ඒ ඔස්සේ ජනතාව මෙහෙයවන්නට ඉදිරිපත් වීම ප්‍රශංසනීයය. සත, වෙදගුරු, ගොවි, කම්කරු පංච මහා බලවේගය ඒකරාශී වූයේ ලංකා සමසමාජ පක්ෂය මගිනි. ඔවුහු සමසමාජ දර්ශනය රටපුරා ව්‍යාප්ත කිරීමට නොපසුබටව ක්‍රියා කළහ. එහෙත් ඊට විරුද්ධව අභියෝග නොතිබුණා නොවේ. බෞද්ධ සංස්කෘතිය පදනම්ව රට හැඩගැසී තිබුණු අවදියක සමසමාජ දර්ශනය තරමක නොව මහා අභියෝගයක් විය. කුල, ආගම්, ජාතිභේද නොතකා හැමට එකට ජීවත් විය හැකි පොදු සමාජ ක්‍රමයක් සමසමාජ දර්ශනය තුළින් ඉදිරිපත් වන විට, එය නොරිස්සූ අය සමසමාජවාදීන් ආගමක් - ධර්මයක් නැති අය වශයෙන් හංවඩු ගසන්නට කොතෙක් නැත් කළත් එය නොතකා සමසමාජ නායකත්වය ක්‍රියා කළ ආකාරය අද විනියා ජාතිහිතෛෂීන්ට, කරුණ සොයාපාරයින්ට මහැඟි පාඩම් ගෙන දෙයි. මුළු සමාජ තලයම දෙදරා යන ලෙස මාක්ස්වාදය පදනම් වූ "සමසමාජය" රටපුරා ගෙන යැමට කරුණ සමිති ව්‍යාපාරයකුත් කම්කරු සමිති ව්‍යාපාරයකුත් දියත් කළ ලංකා සමසමාජ පක්ෂය ජනතා පිළිගැනීමට ලක්වීමට වැඩිකලක් ගියේ නැත. ගමේ ගම් සභාව, නගරයේ නගර සභාව පමණකට සීමා නොවී, රාජ්‍ය මන්ත්‍රණ සභාව, පාර්ලිමේන්තුව, සමසමාජ වේදිකාවක් ලෙස හැඩ ගැසුනි. ඒ තුළින් රට පුරා රැව් පිළිරැව් දුන්නේ නව සංකල්පයන්ය. කමින් එසෙක් ගත කළ ජීවිත වෙනස් කර ගන්නට මග පාදා දී ඒ තුළට ජනතාව ඒකරාශී කිරීමට ලංකා සමසමාජ පක්ෂය ඉදිරිපත් කළ " සමාජවාදී" දර්ශනය, පසුකලෙක දී මෙරට හැම දේශපාලන පක්ෂයකටම (ධනපති පක්ෂ පවා) තමන්ගේ දේශපාලන ගමන් මග සකස් කර ගැනීමට අවශ්‍යවීමෙන් ම ඔප්පු වූයේ සමසමාජ දර්ශනයේ නිවැරදිභාවයය. අවසානයේ ඊට හවුල්වාදීමටත් " සමාජවාදී " වචනය භාවිතා කිරීමටත් මෙරට ධනේශ්වර පංතියට අවශ්‍යවීමත් "සමසමාජ" ජයග්‍රහණයක් නොවන්නේද? අනුනට ඇඟිලි දක්වමින් සිටි රට, ස්වාධීන, ස්වෛරී ජනරජයක් කිරීමට සමත් වූ ලංකා සම සමාජ පක්ෂය 73 වන වසරට පා තබන්නේ නොකිළිටි ඉතිහාසයක් ඇතිවය. එම ඉතිහාසයේ පාඩම් ඉගෙන ගනිමින් ඉදිරියට යා යුතුව ඇත. එසේ කිරීමේ දී ලංකා සමසමාජ පක්ෂයටිත් වර පුර හා විශාල අරගල තුලින් පෝෂණය වූ ආකාරය මැන බැලීම වටී. එසේ මැන බැලීමේ දී පක්ෂය ක්‍රියාත්මකවූයේත්, ශක්තිමත් වූයේත් එම සටන් - අරගල තුලින් බැව් නොකිවමනාය. වතුකරයේත්, නගරයේ වැඩපොළේත් වර්ජනයක් වේවා, බ්‍රේස්ගර්ඩ්ල් සහෝදරයා වෙනුවෙන් කළ අරගලය වේවා, (1953) මහා හර්තාල් සටන වේවා, 1947 වකවානුවේත් 1983 දීත් ඇතිවුන රාජ්‍ය හා පුද්ගලික අංශ වල යෝධ වර්ජන වේවා, එහිදී ලංකා සමසමාජ පක්ෂය ක්‍රියාත්මක වූවා පමණක් නොව ඒ තුළින් නියම සටන්කාමීන් බිහිවීම අපි අගය කළ යුතුය. එහෙත් අපේ "අරමුණ" තවමත් ඉටු වී නොමැත. ඒ සඳහා අපේ ගමන නොනවත්වා ඉදිරියට ගෙනයා යුතුව ඇත. නියම සමාජවාදී රජයක් මෙරට බිහිකිරීම සඳහාත් ඒ තුළ රටේ ජනතාවට ජාති භේදයෙන් තොරව ජීවත්වීමටත් මග සැලසීම අපේ කර්තව්‍යය බැව් අපි පිළිගනිමු. එහෙයින් 73 වසරට අපි පා තබන්නේ " අරගලයෙන්- අරමුණටම" යන ගමනක් ලෙසය. ඒ සඳහා ජනතාව ඒකරාශී කිරීම, ඔවුනට නිසි නායකත්වයක් දීම ලංකා සමසමාජ පක්ෂය ඉදිරි කර්තව්‍යය ලෙස අපි පිළිගනිමු. එය අපි අපේක්ෂා කරන පරිදි ඉටු කිරීමට නම් අපි "පක්ෂය" වශයෙන් දැනටමත් වඩා සංවිධානය විය යුතුය. ශක්තිමත් විය යුතුය. දැන් දැන් අප පක්ෂය කෙරෙහි ජනතාව පෙළ ගැසෙන ආකාරය අනුව ඔවුන් දේශපාලන වශයෙන් සන්නද්ධ කරමින් අපි ඉදිරියටම පා තබමු. ලාභ, ජනප්‍රිය සටන් පාඨ නොව, ප්‍රතිපත්තීන් හැඩගන්වමින් ජනතාව කුල වශයෙන්, ආගම් වශයෙන් ජාතීන් වශයෙන් වෙන් නොකොට "ශ්‍රී ලාංකික" ජනතාව වශයෙන් ඔවුන් සංවිධාන කොට අවසන් අරමුණටම යැමේ අරගලය අපි ඉදිරියේ දී ක්‍රියාත්මක කරමු යැයි මම අවධාරණය කරමි.



- විමලසිරි ද මෑල් -
ල.ස.ස.ප. ප්‍රධාන ලේකම්

**72** වසරක්

වැඩ කරන ජනතාවට ශක්තිය ධෛර්ය ලබාදුන්

## ලංකා සමසමාජ පක්ෂයට

### අපේ උණුසුම් සුභපැතුම් !

### ලංකා කම්කරු සම්මේලනය

සමග

**සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය**

**එක්සත් වෙළඳ සේවා සංගමය**

**ලංකා වතු කම්කරු සමිතිය**

**සමස්ත ලංකා එක්සත් මෝටර් කම්කරු සමිතිය**

## වැට් බද්ද අහෝසි කරනු !

# අද මතුවන දේශපාලනය

2007 දෙසැම්බර් 18 වන දිනට යෙදී තිබෙන ලංකා සමසමාජ පක්ෂයේ 72 සංවත්සරය පවත්වන කාල වකවානුවේදී මතුවන දේශපාලනය ගැන ජනතාවගේ අවධානය යොමු කිරීම සුදුසුය. සමසමාජ පක්ෂයේ ජාතික මෙහෙවර දැන් ඉතිහාසයට අවසන් වී ඇතැයි කල්පනා කරන අය ද අප රටේ සිටී. අනවබෝධිත එම ජනතාව ගැන උරණ නොවී යථාර්ථවාදී පැහැදිලි කිරීමකට රට ඉදිරියේ සමසමාජ තඹ අවදි කිරීම බැලූන වැඩ කොටසක් බැව් ද ප්‍රකාශ කිරීමට සලසුබට හොවෙමි.

## සමසමාජ ඉතිහාසයෙන් බිඳක්

එසේ නම් සමසමාජ පක්ෂය ඉතිහාසගත කාර්ය භාරය තවත් දේශපාලන පක්ෂයකට නොදෙවෙනි වූවක් බව පළමුව මතක් කළ යුතුය.

- සූරියමල් ව්‍යාපාරය
- සමසමාජ පක්ෂය ආරම්භ කිරීම
- නිදහස් සටන
- බ්‍රේස්ගර්ඩ්ල් සිද්ධිය
- 53 ජනතා හර්තාලය
- පැය 8 වැඩ දිනයේ සිට වැඩ කරන ජනතාව විසින් අයිතීන් ලබා ගැනීම
- මහජන ප්‍රභසාධනය සඳහා සෙතිහික රාජ්‍ය බැඳීම
- බ්‍රිතාන්‍ය ආර්ථික වතු සහ නියෝජිත ආයතන වන්දි රහිතව පවරා ගැනීම
- ආර්ථික වාදයට වඩා ඉදිරියෙන් ප්‍රගතිශීලී දේශපාලන පෙලගැස්ම ඇතිකිරීම

යනාදී වශයෙන් ජාතික දේශපාලන සංවිතයේ අද පවතින ජනතා සම්පත් තවත් ලඝු කොට ගත හැකිය. එහෙත් එය මෙම ලිපියේ පූර්ණ අන්තර්ගතය නොවේ. එවන් ඓතිහාසික ජයග්‍රහණ ගැන ආඩම්බරව උදම් ඇනීමකට නොගියත් ඒ ක්‍රියා දාමයේ සමාජ ඵලදායීතාවය මැන බැලීමට අද මිනුම් කෙතෙකුට අවස්ථාව ඇත. 72 වසරක කාල පරිච්ඡේදයටම සමසමාජ පක්ෂයේ රජයක් නොමැතිව ද බ්‍රිතාන්‍ය පාලනයෙන් පසු සමාජ පෙරළියේ සභාකාවය සවුරුත් පිළිගන්නා කරුණකි. එහි භාහිගත වූ න්‍යායාත්මක මතවාදයන්, උනත් දැනුවත් නායකත්වයන්, පක්ෂයේ උපරිම කැපවීමත් අපට දැකිය හැක. මෙහිදී මා පෙන්නුම් කරන්නේ සමසමාජයේ දර්ශනවාදී ක්‍රියාදාමය දැක්වූ බහුතර ජනතා සහභාගීත්වයයි. එම බහුතර ජනතා බලවේගය විසින් පොදු ආර්ථිකයක් ද සමඟින් ගොඩ නැඟීම සඳහා ලද අවස්ථාව ප්‍රභවාදීවූ තත්ත්වයට ගෙන ඒමට හැකිවූයේ අපිරිමිත ලෙස කරන ලද සමසමාජ කැපවීම නිසාවෙනි.

## මුහුණ දුන් ප්‍රතිගාමී බලවේග

එදා මෙදා තුර සමාජයේ ප්‍රතිගාමී බලවේග බලගතුව ක්‍රියාත්මක වූ බව යථාර්ථයකි. ඒවා යටපත් කරගෙන එදා සමාජයේ දී ද අධිරාජ්‍යවාදී පාලනය හා ප්‍රභූ පවුල් වල ආකල්ප වලට හරස්ව සටන් කරනුයේ ජීවිත පරිත්‍යාගයෙන් සැබෑ ජනතා ව්‍යාපාරයක මත සැලසීමට දැරූ සමසමාජ වැඩ කොටස ශ්‍රී ලාංකේය ඉතිහාසයේ අමරණීය තත්ත්වයක් ගන්නා බව අපි සිහිපත් කරන්නෙමු. තවද සමසමාජ පක්ෂය බලාපොරොත්තු වූ ආකාරයටම පළමු පියවර වශයෙන් සමාජයේ පෙරට ගැනීම ක්‍රමවේදයක් ලෙස සලකා සාර්ථක වූ බව පෙන්නුම් කළ හැක. එය පියවරෙන් පියවර පෙරට ආවේය. ඒ වෙනුවෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ හා පාර්ලිමේන්තුවේ දී ද රට උපයෝගී වන ආකාරයට වැඩ පිළිවෙලවල් යොදා ගැනීමට පක්ෂය සමත්වූවාය. මේ පසුබිම තුල වුවද එදා සිටම වාමාංශික ව්‍යාපාරයට පහර පිට පහර එල්ල කරමින් ජනතා ව්‍යාපාරය විනාශ කිරීමට ප්‍රතිගාමීන් දැරූ උත්සාහය අපරිමිතය. ඒ සඳහා කුට උපක්‍රම, කුමන්ත්‍රණ, මැරවර බලවේග සමඟක් නොව රාජ්‍ය බලය පවා දිගින් දිගටම පාවිච්චි කළාය. 1977 දී ප්‍රතිගාමී බලවේග පූර්ණ ලෙස ජයගනිමින් ජේ.ආර්. යුගය බිහිකර ගත්තේය. නැවතත් සූරාකෑමේ හා නව යටත් විජිත වාදයේ හා නව ලිබරල් සංකල්ප ජනතාවගේ කර මතට තල්ලු කර තිබේ. හැගිට ගත නොහැකි ආකාරයට ජනතා ව්‍යාපාරය බිඳට පත්කලා කළේය. ඒවාට ගැලපෙන සෙතිහික බල ව්‍යුහයක් ද ව්‍යවස්ථානුකූලව බල ගැන්වූවාය.

## අවස්ථාවාදය සහ බල තණ්හාව

ජේ.ආර්. ගේ කාලවකවානුව පදනම් කරගෙන ආරම්භ වූ සමාජ යුගය සියල්ල අවුලෙන් අවුලට පත් කර තිබේ. රට ජීවය දෙමින් තවදුරටත් එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ, හෙළ උරුමය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමහර කොටස්, ද්‍රවිඩ එක්සත් විමුක්ති සංවිධානය (ටී එන් ඒ) යන මේ පක්ෂ වල අභ්‍යන්තර දහරාවන් ද ඒකාබද්ධ ගුණයකින් එකට ගැට ගැසී ඇත. ප්‍රගතිශීලී ජනතා ව්‍යාපාරය ආ ගමන්මග ආපස්සට ඇදගෙන යාමට මේ පක්ෂ වල ක්‍රියාදාමය ප්‍රබල වී තිබේ. එය තවදුරටත් අප රට වාමාංශික ව්‍යාපාරය හා ප්‍රගතිශීලී ජනතා ව්‍යාපාරයට එසේ කළ නොහැකි අභියෝගාත්මක තත්ත්වයකි. මේ ප්‍රතිගාමී බලවේග අද දක්වන ආකල්ප සමසමාජය හා වාමාංශික ව්‍යාපාරය ප්‍රබල වූ වකවානු වල ජීවමානව සිටියානම් කවදාවත් බ්‍රිතාන්‍ය පාලනය වෙනස් වීමත්, නව ව්‍යවස්ථාවක් ඇතුළු අධිරාජ්‍ය විරෝධී ආර්ථික බලවේග වලට විරුද්ධව දේශපාලන ජයග්‍රහණ ලබාගැනීමට නොහැකි වනවාට සැකයක් නැත. මෙමඟින් අපට පෙනී යන්නේ ජනතා විමුක්ති පෙරමුණ හා ජාතික උරුමය යන පක්ෂ විසින් ප්‍රගතිශීලී ජනතා ව්‍යාපාරය නොමඟට ගෙන ගිය බවයි. රට හොඳම ජීවමාන උදාහරණ අද දවසේ දී සොයා ගත හැකිය.

## විසඳුම් අවශ්‍ය හඳුනාගත් ප්‍රධාන අර්බුද

අප සමාජය වර්තමානයේ මුහුණ දෙන ප්‍රධාන ගැටළු කිහිපයකි. ඒවා විසඳන්නේ නැතිව කෙසේවත් ඉදිරියට යා නොහැක. රටට අනාගතයක් නැත. ඒ මහා අර්බුදනම් ජනවාර්ගික ප්‍රශ්නය විසඳීම, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රය පුළුල් කිරීම, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පිහිටුවීම, බලය බෙදා හැරීම, නව ජාතික ආර්ථික සංවර්ධනයක් හැඩ ගැස්වීම යනාදී ලෙස ප්‍රජා පාලනය බල ගැන්වීමේ ක්‍රියාව සඳහා පුරප්පාඩුවක් ඇති වී තිබේ. විශේෂයෙන් මෙය නොසලකා හරින දේශපාලන පක්ෂයකට රටේ ජනතාවට විමුක්තියක් සහනයක් ලබාගැනීමට යන මාර්ගයට පිවිසිය නොහැකි බව අපි දැඩි ලෙස ප්‍රකාශ කරමු.



ආනන්ද තිස්ස පෙරේරා
ජාතික සංවිධායක

## අනාගතයට සමසමාජ වැඩ කොටසක්

ධනපති ක්‍රමය තුල වුව සමාජ ප්‍රජාතන්ත්‍රික බලවේග ශක්තිමත් කිරීමේ ඉහත ජේදයේ සඳහන් සංකල්ප ජය ගැනීමට රටේ පාලනය යොමු කර ගැනීම වාමාංශික ව්‍යාපාරයට අපහසු කළ හැකි එකක් නොවේ. තවද සෙසු දේශපාලන පක්ෂ හෝ අන්ත ප්‍රතිගාමීන් පවා ප්‍රසිද්ධියේ මේ ස්ථාවරයට විරුද්ධ තත්ත්වයක් අද දරන්නේ නැත. නමුත් ඒවා ක්‍රියාවට නැංවීම වෙනුවට අවුල් කිරීමේ ප්‍රබල ස්ථාවරයක ඒ අය යෙදී සිටී. මේ පසුබිම තුල වුවද වාමාංශික ව්‍යාපාරයේම ප්‍රබල යෝජනා බවට පත්වී තිබෙන අපේක්ෂිත ක්‍රම වේදය ඉටු කර ගත හැකි වේනම් එය ප්‍රගතිශීලී ජනතා ව්‍යාපාරයේ ප්‍රබල පිම්මකි. ඒ පිම්මට පවා ක්‍රියාත්මක වීමට අකමැති පක්ෂ හෝ ව්‍යාපාර ජනතා දෝහීන් ලෙස හැඩ ගැසීමට අපි මැලි නොවෙමු.

අද තියෙන සමාජ අභියෝග ජයගන්නට නැවතත් මග පසක් කළ යුතුය. ඒ සඳහා වූ බහුතර ජනතා එකතුවක් කරා යන්නට සමසමාජ පක්ෂය ප්‍රමුඛ වාමාංශික බලවේග හා කම්කරු පංතිය, ගොවිජනතාව, බුද්ධිමතුන් හා ශිෂ්‍ය ව්‍යාපාර සමඟ ජනතා ව්‍යාපාරය බල ගැන්වීම ප්‍රමුඛ කටයුත්තකි. මේ අනුව මිනිස්සු මරණ දේපල විනාශ කරන මුදල් කාමාශීතියා කරන ජාතික මෙහෙයුම් වෙනුවට මිනිසුන් ජීවත් කරවන ආර්ථිකය සංවර්ධනය කරන සාධාරණ ප්‍රවර්ධනය කරන වැඩ පිළිවෙල කහවුරු කරගත යුතුය. ඒ අනුව ජනවාර්ගික අර්බුදය විසඳුමක් කරා ගෙන යෑම හා සෙසු ජන වර්ග සමඟ එකම ගමනක් දර්ශනයකින් හා කැපවීමකින් ඉදිරියට යා යුතු වෙමු. ඒ සඳහා ජනතාවගේ විශ්වාසය දිනාගෙන පෙරට යමු.


රාජ්‍ය සේවකයින්ගේ
අයිතීන් වෙනුවෙන්
සටන් කළ
සමසමාජ පක්ෂයේ
72 වන සංවත්සරයට
අපේ උණුසුම්
සුබ පැතුම් !

රජයේ ලිපිකරු සේවා සංගමය


72

වෘත්තීය - සිසු සමිති මර්දනය නොකරනු !

# නිසි මඟට යොමු වෙමුද?

ගතවූ වසර දෙක - තුන කාලයේ දී සමසමාජ දේශපාලනය සමාජය තුළ ඉස්මතු කොට සිහිකිරීම අනාගතයට හේතුවකි. සුනාමියෙන් අවසන් වූ ජනයාගේ නවාතැන් ප්‍රශ්නයෙන් පටන් ගෙන ඉන්පසු කාලයේ ජනතාවට මුහුණ පෑමට සිදුවූ ආර්ථික සහ වෙනත් ප්‍රශ්නයකට සමසමාජ පක්ෂයට තම දේශපාලන තත්ත්වය හා අනන්‍යතාවය තුළින් මැදිහත් වීමට නො හැකිවීම පක්ෂයේ පැවැත්මටත්, රටේ දේශපාලන අනාගතයටත් ඉඳුරාම බලපා ඇත.

මේ සියල්ලටම මුල් වී ඇත්තේ රාජපක්ෂ ආණ්ඩුව තම ජාතිභේදවාදී පදනමින් ඉවත්ව උතුරේ ප්‍රශ්නය සම්බන්ධයෙන් දේශපාලනමය ක්‍රියාදාමයක් සැලසුම් ගැනීමට නොහැකි වීමය. මේ තත්ත්වය තුළ යුද වියදම් අධික වන අතර එක්සත් ජනපද ඇමෙරිකාවේ මුළු ධාවනය කරන යුදවාදී යන්ත්‍රයට අප රට ද කරෙන් බැඳ දැමීය. ලෝක මූල්‍ය ආයතන වලට අධික පොලියක් මත ණය ගැනීමය. රටේ කැකෑරී තිබෙන්නා වූ ප්‍රශ්න කිසිවකට අවශ්‍ය අවධානය සහ මූල්‍ය ආයෝජනය කිරීමට නොහැකි වීමය. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අධ්‍යාපනය, ළමා ඇතුළු අනා



බැටී වීරකෝන්
ල.ස.ස.ප. දේශපාලන සභික

සියල්ලකගේම පෝෂණය අප අවධානය යොමු වීමට තිබුණු ප්‍රශ්නයන්ය.

මේ තත්ත්වය තුළ අප පක්ෂයක් වශයෙන් හිතාඩ වෙමින් ඒ සම්බන්ධ වූ සටන දක්ෂිණාංශික දේශපාලනයට බාර දී අප සිටින්නෙමු. ලබන වසරේත් මේ තත්ත්වයේම අප සිටිනවාද? එසේ නැතිනම් සමසමාජ මගට අපි යොමු වෙනවාද? යන ප්‍රශ්නය අප ඉදිරියේ ඇති බව සැලකිය යුතුය.

# යුද්ධයෙන් දුක් විඳින්නේ කාන්තාවන්

1935 දෙසැම්බර් මස 18 වන දින බිහි වූ ලංකා සමසමාජ පක්ෂයෙන් ගතවූ වසර 72 තුළ මෙරටට සිදු කරන ලද සේවය කුමක්දැයි වක්මින් තරුණ පරපුරට පෙන්වාදීම පාක්ෂිකයින් වන අපගේ යුතුකමය. වගකීමය.

1935 වන විට අප රට පැවතියේ බ්‍රිතාන්‍ය පාලන ක්‍රමයයි. රටේ ධනපති හා රදල ප්‍රභූ පන්තිය අධිරාජ්‍යවාදීන්ගේ පන්දම්කාරයින් වූ අතර සාමාන්‍ය ජනතාව අධිරාජ්‍යවාදීන්ගේ පමණක් නොව දේශීය ධනපතීන්ගේ ද වහලුන් බවට පත්ව සිටියහ. උඩුකයෙහි කුඩායක් දමාගෙන පාරේ යන සාමාන්‍ය වැසියෙක් මේ ධනපතීන් දැක කුඩාය කරෙන් ගෙන අහලට බැස ගිය වකවානුවක මෙම ජනතාවට තම අයිතිය පිළිබඳව වටහාදීමෙන් නිදහසත්, විමුක්තිය උදෙසා ලංකා සමසමාජ පක්ෂය බිහි වූ බව අප සඳහන් කරන්නේ මහත් වූ ආඩම්බරයෙනි.

බ්‍රිතාන්‍ය පාලකයින්ගෙන් අප රට නිදහස් කරගැනීම සඳහා මෙරට සිරගෙවල් කඩාගෙන යාමට පමණක් නොව ඉන්දියාවේ නිදහස් ජාතික අරගලයට සහභාගී වෙමින් අප නායක සහෝදරවරුන්ට සිදු වූ බව වක්මින් තරුණ පරපුර දැන ගැනීමට සැලැස්වීම අපගේ යුතුකමකි.

උද්ඝෝෂණ කිරීමට, වැඩ වර්ජන ඇති කිරීමට පවා මඟ පාදා දුන්නේ අප පක්ෂය බව මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතුය. අද කම්කරු පංතිය භුක්ති විඳින යම් වරප්‍රසාද වේ නම් ඒ ඒ සෑම එකක්ම ලබා ගත්තේ පක්ෂයේ දැඩි කැපවීමෙන්ය. එසේ නොමැතිව කිසිවෙකු මෙම වරප්‍රසාද ඔන්ඳේසියක තබා පුදකල වීවා නොවන බව අද වැඩකරන ජනතාවට තේරුම් කරදීම වටී.

ලංකා සමසමාජ පක්ෂය සෑම අංශයකින්ම දායක වී ඇති අතර, අනාගතයේ සිදුව සෑම ප්‍රශ්නයකටම විසඳුම් ද ප්‍රකාශ කර ඇත. 1970-75 පාලන සමයේ දී පැවති ආණ්ඩුවේ කොටස් කරුවෙකු වශයෙන් සිටි අප පක්ෂ නායකයින් ඉතාමත් දුරදක්නා නුවණින් කටයුතු කරමින් රටේ විදේශ ණය අඩු කළා පමණක් නොව අනාගතය වෙනුවෙන් ආර්ථික සැලැස්මක් යොදන ලදී. එයම ඔවුන් ආණ්ඩුවෙන් පන්නා දැමීමට හේතු වී යයි කිව හැක. එම වැඩ පිළිවෙල නියමාකාරයෙන් ක්‍රියාත්මක කළේ නම් අද පවතින ආර්ථික ප්‍රශ්න ඇති නොවන්නට ඉඩ තිබුණි.

අප නායකයින් ප්‍රකාශ කළේ එක් භාෂාවක් නම් රටවල් දෙකක් භාෂා දෙකක් නම් එක රටයි. මෙසේ අනාගතය පිළිබඳව ඉතාමත් නිවැරදි තීන්දුවක් දුන් කිසිම පක්ෂයක් එහෙක් මෙහෙක් මෙරට බිහි වී නැති බව වක්මින් තරුණ පරපුර තේරුම් ගත යුතුව ඇත.

අද ලංකාවේ බොහෝ දේශපාලන පක්ෂ හා සංවිධාන තිබේ. ඒ අතර මේ ජාතික ප්‍රශ්නය විසා ගෙන කන කොටස් ද සිටිති. අප ජනතාවට අවශ්‍ය වන්නේ නිදහසේ කිසිවෙකුටත් බරක් නොමැතිව, බියෙන් සැකෙන් තොරව ජීවත් වීමට හැකි සමාජ රටාවක් පමණි. එය උදාකරදීම අප සැමගේ වගකීම වේ. අප දිනාගෙන දැ බොහෝ වුවත් දිනා ගැනීමට ඇති දේ එමටය.

අද ප්‍රධානතම ප්‍රශ්නය වනුයේ ජනවාර්ගික ප්‍රශ්නයයි. අද මුළු මහත් සමාජයට මෙන්ම එයින් කොටසක් වන සමස්ථ කාන්තා පරපුරටම විඳින්නට සිදු වී ඇති හැඟැට බොහෝය. කාම අපරාධ දිනෙන් දින වැඩිවෙමින් පවතී. මෙවැනි යුගයක කාන්තා නියෝජිතත්වයක් ඇති පාර්ලිමේන්තුවේ තිබුනත් මෙවැනි දේ වල් ගැන ප්‍රශ්න කිරීමක් හෝ සාකච්ඡාවක් වත් නොකිරීම ගැන කණගාටුවිය යුතුය. අප කාන්තා සම්මේලනයේ නායිකාව ව සිටි සටන්කාමී, අවසාන් සහෝදරියක් වූ විවියන් ගුණවර්ධන වැනි අය මෙම වකවානුව තුළ අප අතර නොසිටීම මුළු මහත් කාන්තා පරපුරටම ඉමහත් පාඩුවකි.

දශක කිහිපයක සිට පවතින මෙම යුද්ධය නිසා වැඩි වශයෙන් ම මානසික පීඩනයන්ට ගොදුරු වන්නේ කාන්තාවන්ය. යුද බිමට ගිය සිය දරුවා එසේත් නැත්නම් තම ස්වාමියා, නැතිනම් තම



මල්ලිකා ජේ. ප්‍රනාන්දු
ලේකම්
සමසමාජ කාන්තා සම්මේලනය

සොහොයුරා නැවත ගෙදර එයිදෝ', නොඑයිදෝ සිතමින් කල්'ගෙවන කාන්තාවන් කොපමණ පිරිසක් සිටිනවා ද? තම ස්වාමිපුරුෂයාගේ වෙන'වීමෙන' කාන්තාවන්ට සිදුවන පීඩනය මුදලකට කිමා කල හැකිද? ඊටත් වඩා උග්‍ර වනුයේ පිය සෙනෙහස නොමැතිව කුඩා දරුවන් තම පියවරුන් ගැන දුක්වීම අන්අයට නොව වැඩියෙන්ම බලපාන්නේ කාන්තාවන්ටය.

යුද්ධය විසඳුමක් බව යයි කියමින් මිනීමරා ගන්නා මේ යුගයේ යුද්ධයෙන් සිදුවන වාසිය කුමක්දැයි අප විසින් සොයා බැලිය යුතුව ඇත. මෙහි තිබෙන වඩාත්ම දුක්මුසු පුවත නම් යුද්ධය කිහන්නා ගේ කුඩාලය බවට පත් කර ගැනීම නිසා කාන්තා අප දිනෙන් දින පීඩනයට පත්වේ.

දශක තුනක පමණ දිගු ඉතිහාසයක් ඇති මෙම කුරිරු යුද්ධය නවතා දැමීම සඳහා මෙතෙක් විසඳුමක් සොයාගැනීමට දකුණේ දේශපාලන පක්ෂ මෙතෙක් එක මතයට නොපැමිණීම ඉතාමත්ම කණගාටුවට කරුණක් වී තිබේ.

ලංකා සමසමාජ පක්ෂයට 72 වසරක් පිරෙන මේ මොහොතේ සියළු දේශපාලන පක්ෂ එක් මතයට යොමු වී යුද්ධයට විසඳුම් ලබා දීම වඩාත් උචිත වන බව කාන්තාවන් වන අපගේ අදහසය.


යුදම් බිංම් බිඳ දමමින් වැව තරන ජනතාවගේ
අයිතීන් සඳහා ගෙන ගිය අරගලයට නායකත්වය දුන්
ලංකා සමසමාජ පක්ෂයේ 72 වන සංවත්සරයට
අවිඳ උණුසුම් සුභපැතුම් එක්කරන්නෙමු.

**ආණ්ඩුවේ කම්කරු සමිති සම්මේලනය**
**සහ**
**අනුබද්ධ වෘත්තීය සමිති**

දුම්රිය සේවක සංගමය
රත්මලාන දුම්රිය කම්කරු සංගමය
එක්සත් ශ්‍රී ලංකා රජයේ සුවසේවා සංගමය
එක්සත් තැපැල් සහ විදුලි සංදේශ සේවක සංගමය
සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වෛද්‍ය සැපයීම් නිදහස් සේවක සංගමය
සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රසායනාගාර කාර්මික සහායක සංගමය
ශ්‍රී ලංකා එක්සත් ගුරු සංගමය
සමස්ත ලංකා පළාත් පාලන ආයතන සේවක වෘත්තීය සමිති සංගමය
සමස්ත ලංකා රජයේ ගොඩනැගිලි කාර්මික සංගමය
වාරිමාර්ග පොදු සේවක සංගමය

72


ජාතික ප්‍රශ්නයට කඩිනම් විසඳුම් ලබාදෙනු !

